# 1.14 ශ්‍රී ලංකාව සඳහා නළු පුහුණු විධික්‍රමයක්

ඉන්දික ෆර්ඩිනැන්ඩු
නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07

---

## ABSTRACT

රංගනයට අභිනවයෙන් පිවිසෙන නළුවා/නිළිය මුහුණ පාන ප්‍රමුඛතම අභියෝගය වන්නේ ප්‍රේක්ෂක පිරිසක් අභිමුව හුදෙකලා වීමේ අපහසුතාවෙන් පැන නඟින අර්බුද ජයගැනීමයි. සමාජීය ශරීරය අභිවහන ශරීරයක් වෙත රූපාන්තරණය වීමේ දී පැන නඟින මෙම අපහසුතාව ඔහු/ඇය නිරුත්සාහකත්වයෙන් හා සත්‍යරූපීත්වයෙන් දුරස් කිරීමට හේතුවෙයි. එහෙත් රංග කලාවේ පරම අරමුණ යථාව ප්‍රතිනිර්මාණය කිරීම වන කල්හි අභිනව නළුවා/නිළිය ප්‍රථම කොටම ඉන් දුරස් වීම ගැටළුකාරී වේ.

සමාජීය සත්ත්වයන් වශයෙන් දෙනෝදාහක් අතර අසහාය ව නැඟී සිටීමට අවශ්‍ය පෞරුෂේය ශක්‍යතාවන් ගෙන් හීනවීම පෙර කවර යුගයකටත් වඩා අද්‍යතන ලාංකේය ජනතාව පිළිබඳ අම්හිරි මෙන් ම බරපතල සත්‍යයක් වී තිබේ. ඓතිහාසික වශයෙන් දල ආධ්‍යාපනික වශයෙන් දල සමාජ දේශපාලනික වශයෙන් දල අනුන් මත යැපුණු, යැපෙන, නව්‍ය යමක් නිර්මාණය නොකරන, එහෙයින්ම අනුකරණයට නැඹුරු වුණු සහ ස්වඡන්දතාව මර්දනය කළ හා නිර්මාණශීලී චින්තනය අවුරාගත් සන්දර්භයක අසහාය පෞරුෂයන් දුලබ වීම ස්වභාවිකය. මෙවැනි සන්දර්භයක රූපණ ශිල්පිශිල්පිනීන් පුහුණු කිරීමේ ක්‍රමවේදය **(Actor Training System),** එකී සන්දර්භීය සුවිශේෂතාවන් ගැන අවධානය යොමුකළ හා සන්දර්භයට ආවේණික ගැටළුවලට පිළියම් සහිත විධික්‍රමයක් වීම වැදගත්ය.

මේ සඳහා ම විසින්, 'නොදන්වා මායිම් දියකර හැරීමේ ක්‍රමෝපාය' මූලික කොට ගත් විධික්‍රමයක් යෝජනා කෙරේ. මේ යටතේ සිදුකරනු ලබන්නේ සමාජීය ශරීරය (සැබෑ ජීවිතය) සහ අභිවහන ශරීරය (රූපණ ක්‍රියාවලිය) අතර බෙදුම් රේඛාව අභිවාහකයාට නොදැනෙන පරිද්දෙන් දියකර හැරීමයි. **(Melt/blur the Boundary)**

සමාජීය වයනයට අනුව හැසිරෙන සමාජීය ශරීරයේ පවතින සත්‍යරූපී බව හා නිරුත්සාහක බව අභිවහන ශරීරය වෙත අත්පත් කරගැනීම සඳහා ප්‍රථමයෙන් සමාජ වයනයට අනුව අභිවහන ශරීරයට හැසිරීමට ඉඩහසර ලබා දීමකි, මේ විධික්‍රමය යටතේ සිදුවන්නේ. එහි දී සමාජීය වයනයේ ඓන්ද්‍රීය සත්‍යරූපීත්වය, අභිවහන ශරීරයේ සත්‍යරූපීත්වය අත්පත් කරගැනීම සඳහා පිටුබලය සපයයි. අභිනව රූපණ ශිල්පිශිල්පිනීන් සමඟ නාට්‍ය නිෂ්පාදනයක් සිදු කිරීමේ දී, වැඩමුළු අවධියේ දී මෙම විධික්‍රමය ආදේශ කළ හැකිය. සමාජ වයනයට අනුව අභිවහන ශරීරයේ හැසිරීම ප්‍රශස්ත සත්‍යරූපීබවක්, නිරුත්සාහක බවක් අත්පත් කරගත් කල්හි සමාජ වයනය වෙනුවට අභිවහන වයනය ආදේශ කෙරේ.

<u>මූලික ස්වභාවය</u>

<u>විධික්‍රමය</u>

<u>රංගමය නිෂ්පාදනය</u>